# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/14/14/6/2021
ඔබේ අංකය / உமது இல / Your No: ........................
දිනය / திகதி / Date: 2024.02.09

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත,

**2019 නව සමෘද්ධි හිමිකම්පත්ලාභීන් සඳහා සමෘද්ධි හිමිකම්පත් ප්‍රදානය වෙනුවෙන් සමාජ ආරක්ෂණ අරමුදලින් දායකත්වය ලබා දීම.**

2019 වර්ෂයේ නව සමෘද්ධි හිමිකම්පත් ලබා දීම වෙනුවෙන් එම ප්‍රතිලාභීන්ගෙන් රු. 500/- බැගින් අය කර නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත රු. මි. 180 ක උපරිමයකට යටත්ව සමාජ ආරක්ෂණ අරමුදලින් වැය දැරීමට සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

02. මෙම සමෘද්ධි හිමිකම්පත් ලබා දීම සඳහා දරන ලද වියදම රජයට වැය බරක් නොවන පරිදි ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා අදාල ප්‍රතිලාභීන්ගෙන් රු.500/- බැගින් අය කිරීමට 2019.06.07 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

03. ඒ අනුව මෙම නව සමෘද්ධි හිමිකම්පත් ලබා දීම වෙනුවෙන් සමාජ ආරක්ෂණ අරමුදලින් රු. 144,733,844.16 ක් වැය දරා ඇත. නමුත් එම ප්‍රතිලාභීන්ගෙන් රු.500/- බැගින් අය කිරීමේ දී දිස්ත්‍රික්ක කිහිපයකින් 40,320,650/- මුදලක් පමණක් ලැබී ඇත. සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩල තීරණ පරිදි එම ප්‍රතිලාභීන්ගේ සහනාධාර මුදලින් දත්ත කළමනාකරණ පද්ධතිය (CRM) හරහා රු. 102,670,000 අය කර ඇත. ඒ අනුව මේ වන විට රු. 142,819,154 ක ප්‍රමාණයක් අය කර ගැනීමට හැකි වී ඇත.

04. ඒ අනුව අදාල ප්‍රතිලාභීන්ගෙන් මෙම මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය දැක්වෙන වාර්තාවක් දිස්ත්‍රික් මට්ටමින් ලබාගන්නා ලෙසත්, ඒ අනුව මෙම ප්‍රතිලාභීන්ගෙන් රු.500/-ක මුදල අය කර ගැනිමට නොහැකි වූ ප්‍රතිලාභීන් හා එසේ අය කිරීමට නොහැකි වීමට හේතු හඳුනාගෙන එම මුදල අය කර ගැනීමට කටයුතු කරන ලෙසත් භාරකාර මණ්ඩලය විසින් උපදෙස් ලබාදෙන ලදී.

05. ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා සමෘද්ධි බැංකු දැනුවත් කර මෙම තොරතුරු 2024.03.12 දිනට ප්‍රථම මේ සමඟ අමුණා ඇති ආකෘතියට සකස් කර ලබා දීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

සී.ඩී. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත - ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ..ස.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

**2019 වර්ෂයේ නව සමෘද්ධි හිමිකම්පත් බෙදා දීමට අදාලව ප්‍රතිලාභීන්ගෙන් 500/- බැගින් අය කිරීම - 500/- ක මුදල අය කර නොමැති ප්‍රතිලාභින් ගේ තොරතුරු**

දිස්ත්‍රික්කය - ..............................................

2019 වර්ෂයේ ලබා දුන් නව සහනාධාර හිමිකම්පත් සංඛ්‍යාව - .................................

| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | බැංකු සංගමය | ප්‍රතිලාභියාගේ නම | ලිපිනය | 500/- අයකර ගැනීමට නොහැකි වූ හේතුව |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

....................................................

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

....................................